ලිංගික අතවරයන් සම්බන්ධ පුවත් වගකීම් සහගතව වාරතා කරමු!
ලිංගික අතවරයන් සම්බන්ධයෙන් වාතර්ා කිරීමේදී, එවැනි වරදක බරපතල භාවය පාඨකයාට ඒ අයුරින්ම ඉදිරිපත් කිරීම, එවැනි අපරාධ අවම කරගැනීම සඳහා සහයක් නොවනු ඇතිදැයි පාඨක අප විමසිය යුතු වේ. ලිංගික අතවරයන් භාවාතිශය ආකාරයකින් පලකරනා විට සහ එවැනි සිදුවීම් සැහැල්ලු කොට වාතර්ා කිරීම ඔස්සේ, ලිංගික අපරාධයන් සමාජය තුළ සාමාන්‍යකරණය වීමද සිදුවිය හැක.
එහිදී මාධ්‍ය විසින් සිය වගකීම සම්බන්ධයෙන් බැරෑරුම්ව සිතීම අවශ්‍ය වේ. ඇතැම් මාධ්‍ය ඒ පිළිබඳව සැලකිලිමත් නොවීම කණගාටුවට කරුණකි. නිදසුනක් ලෙසට, ජපන් භාෂා උපදේශකවරියකට ලිංගික අතවර කළැයි යන චෝදනාව මත අමාත්‍යාංශ උපදේශකවරයෙකුට එරෙහිව පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධ පුවත, (ජූලි 18, 2023) වාතර්ා වී ඇති ආකාරය ගත හැක.
ඒ අනුව, ඔබ සිතනා ආකාරයට, සිදුවීයැයි කියවෙන අතවරය වඩාත් වගකීම් සහගතව වාතර්ා කොට ඇත්තේ කුමන පුවත් සිරස්තලයද?
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධමර් කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!